# මිය ගියවුනට පින් දීම

**අග්ගමහාපණ්ඩිත අතිපූජනීය මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි**

බුද්ධාගමෙහි සඳහන් වන මළවුන් සිහි කිරීමේ ක්‍රමය හෙවත් මිය ගියවුන් හට පින් දීමේ පිළිවෙළ කොතරම් ක්‍රමවත් ද අර්ථවත් ද ප්‍රඥාගෙ ්චර ද යි කාටත් වැටහෙනවා ඇත. මළවුන් සඳහා හැඬීම, ශෝකවීම, සොහොනට ගොස් පහන් දැල්වීම, මල් වඩම් තැබීම බුදුරජාණන් වහන්සේ අනුමත නො කළ සේක. හැඬීමෙන් ශෝකවීමෙන් පහළ වන්නේ අකුසල් සිත් ය. එයින් තමන්හට වත් අනුන්හට වත් වැඩක් යහපතක් නොවෙනුවා පමණක් නොව තමනට අකුසල් ද සිදු වෙයි. ඒ මොහොතට හෝ තමා ගුණයෙන් පිරිහෙයි. සිදුහත් කුමරු උපන්දා රජ ගෙදරට පැමිණි ධ්‍යානලාභී කාලදේවල තවුසාණෝ කුමරුගේ අනාගතය බලා සිනාසී දෙවනු ව හැඬූහ. ඒ ඇඬූ මොහොතෙහි උපන් අකුසල් සිත් නිසා ඔහු උත්තරී මනුෂ්‍ය ගුණයක් වන ධ්‍යානයෙන් පවා ඒ මොහොතට හෝ පිරිහුණු සැටි සිහි කළ යුතු ය.

### පින් දීමට දින නියමයක් තිබේ ද?

බුදුරජාණන් වහන්සේ මිය ගියවුන්හට පින් දෙන්නට යයි නියම කළා විනා තුන් වැනි හත්වැනි අට වැනි දින ආදී වශයෙන් දින නියමයක් නො කළහ. දින නියමය උන් වහන්සේට පෙර පටන් මළවුන් සිහි කිරීමට පැවැති චාරිත්‍රයෙකි. බෞද්ධයන්ට ද මේ චාරිත්‍රය අනුගමනය කිරීමට ප්‍රධාන අරමුණු කර ගත හැකි විය. සමහර විට ඉතා හොඳින් සිටි අය පවා අන්තිම මොහොතෙහි නරක සිත් පහළ වීමෙන් දුගතියෙහි උපන් බව පෙනෙයි. එහෙත් එබන්දෝ වැඩි කලක් එබඳු තැන්වල දුක් නො විඳිති. හත් දිනෙන් අට දිනෙන් එයින් මිදී සුගතියෙහි උපන් බව බොහෝ කථා ප්‍රවෘත්තිවලින් පෙනෙයි. එබඳු අය පවා එසේ මිදෙන විට මේ පින ද පමුණුවා අධිකතර සම්පත්තියට පමුණුවනු සඳහා හත් දින නියමයක් තිබෙන විට පින් ලබන අයට ද එක්තරා පහසුවක් වෙයි. අපේ නෑයන් අපට පින් දෙන්නේ අසුවල් අසුවල් දිනයන්හි යයි සිතා දිනය නො වරදින ලෙසට බලාපොරොත්තු විය හැකි වෙයි.

මෙසේ කරුණු වශයෙන් සලකා බලන විට දින නියමයේ චාරිත්‍රය හළ යුතු ද නොවේ. එසේ ම දිනයට වහල් විය යුතු ද නොවේ. බුද්ධාගමේ පින්කම් උසස් වන්නේ කරන අයගේ සිත්වල යෙදුණු ශ්‍රද්ධා ප්‍රඥාදි ශෝභන චෛතසිකයන්ගේ පමණට විනා දිනයෙන් වත් බාහිර අලංකාරයෙන් වත් නොවේ. සමහර පින්වතුන් බුද්ධාගමයෙහි පින්කම්වලට නියම තත්ත්වය නොසැලැකීම නිසා මිය ගියවුන්හට පින්දීමේ දිනය පිළිබඳ නොයෙක් අසතුටු අමනාප හඳගන්නා බව පෙනෙයි. ඇතැම් විට කලින් බාරගත් පන්සලේ වෙන කටයුතු නිසා හෝ එකී දිනයට පින්කම බාර නොගත හොත් ස්වාමීන් වහන්සේ සමඟ ද අමනාප වෙති. දයකකම් ද අත් හරිති. එය ඉතා නො මැනැවි. ප්‍රඥාවට මුල් තැන දුන් බුදුරජාණන් වහන්සේට අගෞරවයකි. නිවැරදි චාරිත්‍ර නො හළ යුතු බැවින් එකී පින් දීම නියමිත දිනයට ම පිළිවන් නම් ඉතා මැනැවි. එහෙත් දිනය වෙනස් වීමෙන් පින්කමේ අඩුවක් කොට සැලැකීම සහමුලින් ම අත්හළ යුතු ය.

**පැන් වැඩීමේ සිරිත**

වැදගත් දීමනාවක දී පැන් සාක්ෂ්‍යයට ගැනීම පුරාණ චාරිත්‍රයෙකි. කුමාරයකුට ඔටුන්න පවරා දීමෙහි දී හිස පැන් වැඩීමත් කුලකාන්තාවක ස්වාමියකුට පවරා දීමෙහි දී අත් පැන් වැඩීමත් ආදිය පෙරදිග සිරිත් බව කවුරුත් දනිති. නිවැරදි චාරිත්‍රයනට බුදුරජාණන් වහන්සේ විරුද්ධ නො වූහ. එහෙයින් ආරාම පූජාදියෙහි දී උන් වහන්සේ අත් පැන් වඩා එය කළහ. පින ද වැදගත් දීමනාවෙකි. එහෙයින් එද පටන් මේ දක්වා ම විශේෂයෙන් මිය ගියවුන්හට පින් දීමේ දී මේ යහපත් චාරිත්‍රය නොකඩවා පැවැත්තේ ය. එය කරන විට ද පැන් ලබන භාජනය උතුරා යන්නට වත් කිරීම ද චාරිත්‍රයෙකි. පින් ලබන අයට සැප උතුරා යේ වා යන කරුණා හැඟීමත් එයින් පහළ වෙයි. පින වැදගත් දීමනාවක් හෙයින් පිරිසිදු භාජන ගෙන සුදුවතක් අතුරා ඒ මතැ තබා පැන් වැඩීම ද නැණවතුන්ගේ සිරිතෙකි. ඔටුන්නක් දීමේ දී හා කුල කාන්තාවක දීමේ දී එය කරන ගෞරවාකාරය සිහි කළ යුතු ය. මෙසේ සලකා බලන විට පින් දීමෙහි දී පැන් වැඩීම වැදගත් චාරිත්‍රයක් වුව ද එය නොකිරීමෙන් පමණක් පින්කම අඩු ලුහුඬු නොවන බව ද සිත තබා ගත යුතු ය. බෞද්ධයෝ අන්ධ විශ්වාසය අත්හැර නුවණින් කරුණු විමසා බලා පින්කම් කිරීමෙහි යෙදෙත් වා !

*උපුටා ගැනීම - 2561/2018 බෞද්ධ ළමයා බක් කලබ*

Go to Table of Contents